**වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල - 2013**

**------------------------------------------------------------**

වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 ජනවාරි 25 දින නිකුත් කරන ලද අංක 1533/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පළ කරන ලද 2008 අංක 01 දරන මෝටර් වාහන වායු විමෝචන පාලනය කිරීම් නියෝග යටතේ සහ 2009 අංක 8 දරණ මෝටර් වාහන පනත මඟින් සංශෝධිත මෝටර් වාහන පනතේ (පරි. 203) 29 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

**ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

භාණ්ඩාගාර බිල්පත් ආයෝජන සඳහා ලැබිය යුතු පොළිය රු.44,246 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි වලට යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | ව්‍යවස්ථාපිත විධිවිධාන | |
| | 2003 අංක 17 දරන රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් (සංශෝධන) පනත මගින් සංශෝධිත රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥා පනතේ 2 (4 ආ) (අ) , (ආ) උප වගන්ති | වායු විමෝචන අරමුදලේ සේවයේ නියුක්ත නිලධාරීන් 06 දෙනෙකු වෙනුවෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් අය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 371(2) (ආ) වගන්තිය | මාණ්ඩලික නිලධාරියකුට තත්කාර්යය අතුරු අග්‍රිමය ලෙස රු.20,000 ක් ලබාදිය හැකි වුවත්, එකී සීමාව ඉක්මවා නිලධාරීන් 10 දෙනෙකුට අත්තිකාරම් ලබාදීමට කටයුතු කළ අවස්ථා 36 ක් නිරීක්ෂණය විය. |
| | (ii) මුදල් රෙගුලාසි 395 (ඇ) | මාසයක් ඉකුත් වී ඊළඟ මාසයේ 15 වන දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (iii) මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත්කල නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ එකතුව රු.115,458 ක් වූ මාස 06 ට වැඩි චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2 (ආ) ඡේදය | ගෙවීමට ඇති මුදල් හා අනෙකුත් වගකීම් නිරවුල් කිරීමෙන් පසු ඉතිරිවන අතිරික්ත මුදල අප්‍රමාදව ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම හා අතිරික්ත අරමුදල් බාහිර ආයතනයන්හි ආයෝජනය කර ඇති විටෙක ඒවා කල්පිරුණු වහාම ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට කටයුතු කළ යුතු වුවද, එකතුව රු.190,909,921 ක් වූ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර සුරැකුම්පත් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.171,131,419 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු.177,236,281 ක අතිරික්තයක් විය. ඒ අනුව, ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,104,862 ක අඩුවීමක් පෙන්නුම් කෙරේ. මෙම අඩුවීම සඳහා ක්ෂයවීම් රු.9,485,555 කින් වැඩිවීම හා ජනමාධ්‍ය වැඩසටහන සඳහා වියදම රු. 2,424,936 කින් වැඩිවීම යන කරුණු ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2012 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ එක් එක් වාහන පංතීන් අනුව ලියාපදිංචි කර ඇති මුළු වාහන සංඛ්‍යාවෙන් 2013 වර්ෂයේදී වායු විමෝචන සහතික ලබාගත් වාහන සංඛ්‍යාව පිළිබඳව විස්තරයක් පහත දැක්වේ. (මෙරට ලියාපදිංචි කරන ලද අළුත්ම වාහන සඳහා වසරක කාලයක් වායු විමෝචන පරීක්ෂණ සහතික ලබා ගැනීම අවශ්‍ය නොවන බැවින් 2012 දෙසැම්බර් 31 දින දක්වා ලියාපදිංචිය සිදු කරන ලද වාහන සංඛ්‍යාව මෙම විශ්ලේෂණය සඳහා පදනම් කරගෙන ඇත.)

| | **2012 දෙසැම්බර් 31 දිනට පැවති මුළු වාහන සංඛ්‍යාව** | **2013 වර්ෂයේදී වායු විමෝචන සහතික ලබා ගත් වාහන සංඛ්‍යාව** | **2013 වර්ෂයේදී වායු විමෝචන සහතික ලබා නොගත් වාහන සංඛ්‍යාව** | **පැවති වාහන සංඛ්‍යාවෙන් සහතික ලබා නොගත් වාහන සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| යතුරු පැදි | 2,546,447 | 1,657,906 | 888,541 | 35 |
| ත්‍රිවීල් | 766,784 | 698,851 | 67,933 | 09 |
| මෝටර් කාර් | 499,714 | 358,392 | 141,322 | 28 |
| ද්විත්ව කාර්යය වාහන | 280,143 | 265,391 | 14,752 | 05 |
| ලොරි රථ | 323,776 | 205,456 | 118,320 | 37 |

| | | | | |
|---|---|---|---|---|
| මෝටර් කෝච් / බස් | 91,623 | 46,868 | 44,755 | 49 |
| | ------------ | ------------ | ------------ | |
| එකතුව | 4,508,487 | 3,232,864 | 1,275,623 | |
| | ======= | ======= | ======= | |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාහන 1,275,623 ක් සඳහා එනම්, මුළු වාහනවලින් සියයට 28 ක්ම වායු විමෝචන පරීක්ෂණ සහතික ලබාගෙන නොතිබුණි.

(ආ) ඉහත සඳහන් පරිදි සියළුම වාහනවලට වායු විමෝචන සහතික ලබා නොගැනීමේ තත්ත්වය අනුව ව්‍යාජ ලෙස වායු විමෝචන පරීක්ෂණ සහතික ලබාගන්නා හෝ වායු විමෝචන සහතික ලබා නොගන්නා වාහන තිබේද යන්න හඳුනාගැනීම සඳහා අරමුදල විසින් විධිමත් වූ වැඩ පිළිවෙලක්ද ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඇම්බියන්ට් එයාර් කොලිටි මොනිටරින් ස්ටේෂන්ස් (Ambient Air Quality Monitoring Stations) දෙකක් හා එයාර් කොලිටි ඩිස්ප්ලේ බෝඩ් (Air Quality Display Board) දෙකක් සැපයීම සඳහා මිල ගණන් කැඳවීමට පුවත්පත් තුනක දැන්වීම් පල කිරීමට සමාලෝචිත වර්ෂයේදී රු.70,224 ක් ගෙවා තිබුණි. එහෙත්, මෙම පුවත්පත් දැන්වීමේ දින වැරදියට සඳහන් කිරීම නිසා නැවත දැන්වීමක් පල කිරීම සඳහා රු.20,832 ක මුදලක් වැය කර තිබුණු අතර, 2014 සැප්තැම්බර් 30 දින වනවිටත් මිලදී ගැනීම් සිදු කර නොතිබුණි.

(ආ) වායු විමෝචන මධ්‍යස්ථාන පරික්ෂා කිරීම, මාර්ගයේ ධාවනය වන වාහනවල වායු පරික්ෂා කිරීම වැනි කාර්යයන් සඳහා කලින් පිළියෙල කර ගත් වැඩ සටහනකට අනුව සිදු කල යුතු වුවත් එසේ කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පරිසර දූෂණයට ඉවහල් වන වාහනවලින් පිටවන දුම් පාලනය කිරීමේ පරමාර්ථයෙන් වායු විමෝචන අරමුදල ක්‍රියාත්මක කරනු ලැබුවද, එකී අරමුණු ප්‍රමාණවත් ලෙස ඉටු කරගෙන තිබේද, නැද්ද යන්න සනාථ කර ගැනීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පෙර පැවති තත්ත්වය සහ ක්‍රියාත්මක කිරීමෙන් පසු පැවති තත්ත්වය පිළිබඳව සංසන්දනාත්මක පාරිසරික දත්ත පදනම් කරගෙන විධිමත් පරිදි ඇගැයීමක් සිදු කර නොතිබුණි.

(ආ) මෙම අරමුදල ආරම්භ කරන ලද දිනය වන 2008 නොවැම්බර් 17 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා කාලච්ඡේදය තුල වායු විමෝචන පරීක්ෂණ ගාස්තු ලෙස පෞද්ගලික සමාගම් දෙක විසින් අයකරනු ලබන ගාස්තුවෙන් සියයට 10 ක කොටස ලෙස එකතුව රු.522,127,270 ක මුදලක් අරමුදල වෙත එවා තිබුණද, සමාගම් දෙක විසින් පරීක්ෂා කරන ලද සියළු මෝටර් වාහනවලට අදාලව අය කරන ලද වායු විමෝචන පරීක්ෂණ ගාස්තුවලින් අරමුදලේ කොටස නිවැරදිව එවා තිබේද? නැද්ද යන වග තහවුරු කර ගැනීම සඳහා අරමුදල තුළ නිශ්චිත වූ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.4 ආර්ජික නොවූ ගනුදෙනු

අරමුදල මගින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් 4 ක් සඳහා සහභාගී වූ නිලධාරින්ට සංග්‍රහ වියදම් සඳහා රු.668,348 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. බිල්පත් වලට අනුව නිලධාරින් 795 දෙනෙකුට ආහාර සපයා තිබුණද, පැමිණීමේ ලේඛණයට අනුව නිලධාරීන් 644 දෙනෙකු පමණක් සහභාගී වී තිබුණි. මේ අනුව පුහුණු වැඩසටහන් සඳහා සහභාගී නොවූ නිලධාරින් 151 දෙනෙකු වෙනුවෙන් ආහාර සැපයීම වෙනුවෙන් රු.126,944 ක් වැය කර තිබුණි.

## 5. අයවැය ලේඛනමය පාලනය

අරමුදලේ වියදම් 08 ක් සම්බන්ධයෙන් අයවැය ඇස්තමේන්තුව හා තථ්‍ය වියදම් අතර සියයට 25 සිට සියයට 95 අතර පරාසයක විචලතා පැවතුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදවාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර මෝටර් රථ කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අයවැය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ගිණුම්කරණය